# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 48 දරන කුඩාඋඩුවේ නාලන්ද සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 20 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1993 ඔක්තෝබර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1993 අංක 48 දරන කුඩාඋඩුවේ නාලන්දා සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 20 වන දින]

**එල්. ඩී.—ඕ. 69/**

**කුඩාඋඩුවේ නාලන්දා සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"කුඩාඋඩුවේ නාලන්දා සංවර්ධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙනයාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ කුඩාඋඩුවෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින්ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1993 අංක 48 දරන කුඩාඋඩුවේ නාලන්ද සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කුඩාඋඩුවේ නාලන්ද සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භවීමේ දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) "කුඩාඋඩුවේ නාලන්ද සංවර්ධන සමිතියේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මෙහි මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් "කුඩාඋඩුවේ නාලන්දා සංවර්ධන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ආදර්ශවත් බෞද්ධ භික්ෂු පරපුරක් ඇති කිරීමට කටයුතු කිරීම ;

(ආ) භික්ෂූන් වහන්සේලා හා ගිහි බෞද්ධයන් අතර සමීප සම්බන්ධතාවක් වර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාමෙන් දැහැමි සමාජයක් පිහිටුවීම ;

(ඇ) රටවැසියන් අතර වාර්ගික, ආගමික හා කුල වශයෙන් වූ භේද තුරන් කිරීම සහ ජාතික අනන්‍යතාව ප්‍රවර්ධනය කිරීම සහ ජාතික සමගිය වර්ධනය කිරීම ;

(ඈ) මත් ද්‍රව්‍ය හා මත්පැන්වල ඇති භයානකත්වය පිළිබඳ මහජන අවබෝධය ඇති කිරීම අරභයා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ;

(ඉ) සාමාජිකයන් තුළ අධ්‍යාපනික, ආර්ථික, සාමාජික හා සංස්කෘතික අභිවර්ධනයක් ඇතිකර ගැනීමට පහසුකම් ලබා දීම ; සහ

(ඊ) කුඩාඋඩුවේ නාලන්දා පිරිවෙණ හා ඊට අනුබද්ධිත විහාරස්ථාන සහ අධ්‍යාපනික ආයතන දියුණු කිරීම හා පවත්වා ගෙන යාම ද වේ.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ ඇප නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවරාකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කාරණා ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාත්මක කිරීමේ ද බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවෙහි තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, එකී රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි සහ එකී රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන නිලධරයන් සහ වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ විධායක කාරක සභාවක් විසින් පාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සමිතියේ විධායක කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද විධායක කාරක සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය කරගෙන යාම සඳහා ද සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එකී පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාමාජික

යන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) තත් කාලයෙහි බල පවත්නා සංස්ථාවේ කිසිම රීතියක් වෙනස් කිරීම, හෝ ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම, සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් මිස කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම විධායක කාරක සභාව විසින් අනුමත කරනු ලබනතෙක් මිස බල සහිත නොවිය යුතු ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලබන චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට නීතිය අනුව බලය හා ශක්තානුභාව සංස්ථාවට ඇති අතර, ඒ දේපළ විකිණීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියළු දේපළ දැරිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සමිතියේ පැවති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සමිතියට අය විය යුතු සියලු ණය සහ සමිතියට ගෙවිය යුතු සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂ්‍යකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.